# ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

## ජංගම පරික්ෂක තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

### යහපත්, ගුණාත්මක ප්‍රවාහන සේවයක සාඩම්බර කොටස්කරුවෙකු වීම සඳහා අප හා එක්වන්න.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ ජංගම පරීක්ෂණ අංශයේ පුරප්පාඩු පවතින ජංගම පරීක්ෂක තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත පහත සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙය බස්රථවල මාර්ගයේ සේවයේ යෙදෙන සේවක කණ්ඩායම්වල රාජකාරි පරීක්ෂා කරන තනතුරකි. (ත්‍රිවිධ හමුදාවේ නිත්‍යානුකූලව සේවයෙන් ඉවත්වූ අයවළුන් සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

**පවතින පුරප්පාඩු**

ප්‍රධාන කාර්යාලයේ ජංගම පරීක්ෂණ අංශයේ ජංගම පරීක්ෂක තනතුරු 50 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

**01. ජංගම පරීක්ෂක තනතුර (කොන්ත්‍රාත්)**

**අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්**

I. අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී සිංහල/ දෙමළ සහ ගණිතය යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් සමත්වීම.

II. අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම.

III. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා මාස හයකට (06) නොඅඩු කාලයක පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම..

IV. වයස අවුරුදු 18-45 අතරවීම.

V. මනා සෞඛ්‍ය තත්ත්වයකින් හෙබිවීම හා ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

VI. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

VII. ත්‍රිවිධ හමුදාවේ සේවකයෙකු ඉල්ලුම් කරන්නේ නම් ත්‍රිවිධ හමුදාවේ ස්ථිර සේවයෙහි හෝ ස්වේච්ඡා සේවයේ සේවය කර ගෞරවාන්විතව නිත්‍යානුකූලව ඉවත්වූ අයෙකු විය යුතුය.

**පොදු කොන්දේසි හා ලබාදෙනු ලබන පහසුකම්**

- සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයාගේ දායකත්වය 08% වන අතර සේව්‍යයා විසින් 12% ක්ද දායකත්වය දරනු ඇත. සේවක භාරකාර අරමුදල සඳහා සේව්‍යයා විසින් 03% ක දායකත්වයක් ලබාදේ.
- මාසික මූලික කොන්ත්‍රාත් දීමනාව
- මූලික කොන්ත්‍රාත් දීමනාව 46,220 හා ජීවන අංක දීමනාව රු. 17,800/- ඇතුළුව අතිකාල දීමනා, ගමන් වියදම් දීමනා හා ජංගම පරීක්ෂණ මහතුන්ට ශ්‍රීලංගම විසින් ගෙවනු ලබන අනෙකුත් දීමනා ගෙවනු ලැබේ. බඳවා ගැනීමෙන් පසුව කාර්ය චක්‍ර පදනම මත සේවයේ යෙදවේ.
- බඳවා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් පසුව වෛද්‍ය පරීක්ෂණයට යොමුකර සමත්වන අයදුම්කරුවන් පුහුණු පාඨමාලාවක් පවත්වා මණ්ඩලීය පිළිවෙත් අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ඇත.
- බඳවා ගැනීමෙන් පසුව සේවා ස්ථානය සඳහා යාමට හා ඒමට කිලෝ මීටර් 30ක් ඇතුළත ගමන් අවසර පත්‍රයක් ලබා දෙනු ලැබේ.
- බඳවා ගැනීම පිළිබඳව අවසන් තීරණය ශ්‍රීලංගම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

ඉහත තනතුර සඳහා අයදුම් කිරීමට කැමති අයදුම්කරුවන් පහත සඳහන් ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පතක් "ප්‍රධාන විධායක නිලධාරි, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2026-09-30 දිනට පෙර ලැබෙන ලෙස එවිය යුතුය. ලිපිය බහාලන කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි තමන් අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදි පාසල් හැරයාමේ සහතිකය (ශිෂ්‍ය කාර්ය දර්ශනය හා තමා සේවය කළ ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සේවයෙන් නිත්‍යානුකූලව ඉවත්වීමේ සහතිකය ඉදිරිපත් කළ යුතුය) අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතුවේ. ආකෘති පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය**
**අංක 200, කිරුළ පාර,**
**නාරාහේන්පිට,කොළඹ 05.**

Gazette.lk

**අයදුම්කරන තනතුර ..................................**

1. (අ) අයදුම්කරුගේ සම්පූර්ණ නම:- ....................
..................................................

(ආ) මුලකුරු සමග නම :- ..................................
..................................................

2. ලිපිනය :- ..................................................
..................................................

3. i උපන් දිනය :- ..................................
ii 2026-09-30 දිනට වයස:- අවුරුදු
.................. මාස .................. දින ..................

4. ජාතික හැඳුනුම්පත් අංකය :- ..............................
..................................................

5. දුරකථන අංකය..................................................
WhatsApp අංකය ..................................
Email ලිපිනය ..................................................

5. ආගම :- ..................................................
6. ජාතිය :- ..................................................
7. i ඔබ ශ්‍රීලාංකික පුරවැසියෙක්ද යන වග :-..
..................................................
ii එසේ නම් ලියා පදිංචියෙන්ද
පරම්පරාවෙන්ද යන වග :-..............................
..................................................

8. අධ්‍යාපන සුදුසුකම්
i අ.පො.ස. (සා/පෙළ)
**වර්ෂය ..................................**
**විභාග අංකය ........................**

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |

ii. අ.පො.ස. (උ/පෙළ)
**වර්ෂය ..................................**
**විභාග අංකය ......................**

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |

09. සේවය කළ ආයතනය (හමුදාව) ........................
....... (යුධ/නාවුක/ගුවන්)
i. සේවයට බැඳුනු දිනය ..............................
ii. ඉවත්වූ දිනය ..................................
iii. ඉවත් වීමට හේතුව ..............................
iv. ස්ථිර/ ස්වේච්ඡා ..................................

10. සේවා පළපුරුද්ද ඇත්නම් ඒ පිළිබඳ විස්තරය
i. සේවය කළ ආයතනය ..............................
ii. කාලය ..................................
iii. සේවයෙන් ඉවත්වූයේ නම් ඒ පිළිබඳ විස්තර ..................................

11. අනෙකුත් සුදුසුකම්

12. i මීට ඉහතදී උසාවියකින් ඔබ වරදකරු වී තිබේද? :- ..............................
ii එසේනම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න :-..............................
..................................................

ඉහත සඳහන් විස්තර මාගේ දැනීම හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික වන අතර අසත්‍ය තොරතුරක් සැපයුවහොත් ඒ සම්බන්ධව මණ්ඩලය ගනු ලබන ඕනෑම තීරණයකට එකග වන බවද සහතික වෙමි.

**දිනය ..................................**
**අයදුම්කරුගේ අත්සන ..................................**